# 22



# මව්ලූආත් වල බිහි වීම හා එහි බලපෑම්

හදීස් ආරක්ෂා කිරීමේ සේවයෙහි අපගේ මුතුන් මිත්තන් වන සහාබිවරුන්, තාබිඊන්වරුන් හා ඔවුන්ට පසුගාමී ව පැමිණි ඉමාම්වරුන් විසින් එය මැනවින් ඉටු කළ බව පෙර පාඩමෙහි අපි ඉගෙන ගත්තෙමු. ඔවුන්ගේ මෙම උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස පෙර නබිවරුන්ගේ මගපෙන්වීම් ඔවුන්ගේ අනුගාමිකයින් විසින් හෝ අනුගාමිකයින්ගේ නොසැලකිල්ල හේතුවෙන් හෝ විනාශ වී භාවිතයෙන් ඉවත් වූවාක් මෙන් අවාසනාවන්ත තත්ත්වයක් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ සුන්නාහ්වට සිදු වීමට ඉඩ නොදී ආරක්ෂා කරන ලදි.

ව්‍යාජ හදීස් ගෙතීම බරපතල වරදකි, යන්න පහත සඳහන් නබි වැකියෙන් අවබෝධ කරගත හැකි ය.

مَنْ كَذَبَ عَلَيَّ مُتَعَمِّدًا فَلْيَتَبَوَّأْ مَقْعَدَهُ مِنَ النَّارِ

"යමෙකු වුවමනාවෙන් ම මා සම්බන්ධව මුසා පවසන්නේ ද ඔහු තම වාසස්ථානය ලෙස නිරය තෝරා පත් කර ගනිත් වා" (බුහාරි) යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා මෙලෙස පෙර දැනුම්දීමක් සිදු කර අවවාද කිරීමෙන් හදීස් මෙවැනි අවදානම් තත්ත්වයකට පත් වන බව අඟවා ඇත.

හදීස් කට පාඩමින් හුවමාරු වී ව්‍යාප්තව පැවතීම, තමන්ට පක්ෂව කටයුතු කිරීමට උත්සාහ කළ විවිධ කණ්ඩායම් තම ප්‍රතිපත්ති, සිතුවිලි අරමුණු යනාදිය තමන්ට පක්ෂපාතව ඉෂ්ඨ කර ගැනීමට හෝ තම කණ්ඩායමට සහය ලබා ගැනීමට ඔවුහු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ නාමයෙන් ව්‍යාජ පුවත් රැසක් ගොතා ප්‍රකාශ කළහ. ඒවා ජනතාව අතර පහසුවෙන් ම ව්‍යාප්ත වී ජනතාවට බලපෑම් කිරීම ආරම්භ විය.

මව්ලූආත් පිළිබඳ සැළ වූ වහා ම එකල ගෞරවනීය ඉමාම්වරුන් එයට කෙසේ විරුද්ධ වුණි ද යන්න පිළිබඳව ඉමාම් මුහම්මද් ඉබ්නු සීරීන් රහ්මතුල්ලාහි තුමා මෙලෙස සඳහන් කළේ ය. ''(උස්මාන් රළියල්ලාහු අන්හු තුමාට විරුද්ධ ව) කෝලාහල ඇති වන තුරු ද 'ඉස්නාද්' (නිවේදනයන්ගේ අනුපිළිවෙළ) පිළිබඳ ව විමසීමට ලක් කිරීම පුරුද්දක්ව නොතිබුණි. එම කෝලාහලයට පසුව හදීසය නිවේදනය කරන්නාගෙන් ඔබට එම හදීස් නිවේදනය කළ අය සඳහන් කරන්න, යැයි විමසන ලදි. එම නිවේදකයන් අහ්ලුස් සුන්නාහ්වට අයත් වූවන් නම් ඔවුන්ගේ හදීස් පිළිගනු ලැබිණි. කෝලාහල ඇති කරන්නන් වූවේ නම් ඔවුන්ගේ හදීස් ප්‍රතික්ෂේප කරන ලදි.''

**නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා නොපැවසූ නොකරපු, හෝ අනුමත නොකළ පුවත් එතුමාගේ නාමයෙන් ගොතන ලද දේ " මව්ලූඃ" යැයි, ඉමාම්වරුන් අර්ථ ගන්වා ඇත.** මව්ලූආත්, ළඊෆ් වන හදීස්වලටත් වඩා අඩු තත්ත්වයෙහි ලා සැලකේ. මක්නිසාදයත්, ළඊෆ්හි පදනම හදීස් නම් වූ ගණයට අඩංගු වේ. මව්ලූඃ යන්න, එහි නිවේදකයන් අතරින් කෙනෙකු හෝ කිහිප දෙනෙකු මුසා පවසන්නන් යැයි හඳුනාගත් හෙයින් ඒවා හදීස් නම් වූ ගණයට අඩංගු කිරීම නොගැළපේ. ,,එම නිසා මේවා අවවාද කිරීමේ අරමුණ රහිතව වෙනත් කිසියම් අවස්ථාවක දී භාවිතා කිරීම වැරැදි ක්‍රියාවකි.

මෙවැනි මව්ලූආත් වන හදීස් ගොතන ක්‍රියාවලිය කලීෆා උස්මාන් රළියල්ලාහු අන්හු තුමාට විරුද්ධ ව දියත් කළ කුමන්ත්‍රණයෙන් පසුව බිහිවිය. මෙහි සමාරම්භකයා අබ්දුල්ලාහ් බින් සබඃ නම් යුදෙව් වංචනිකයා බව ඉමාම්වරුන් සඳහන් කර ඇත. ඔහුගෙන් පසු විවිධ අරමුණු මත කණ්ඩායම් රැසක් විසින් මෙම පහත් ක්‍රියාව කරන ලදි. ඒවා මෙසේ දැක්විය හැකි ය.

## 01. අල්ලාහ්ගේ දයාව ලබාගැනීම.

ආගමික ගැඹුරු දැනුමක් රහිත, නැමදුම්වලට දැඩි ලැදි බවක් හා භක්තියක් සහිත කිහිපදෙනෙකු ජනතාව නැමදුම්වලට ලැදි කරවීමටත් පාපි ක්‍රියාවන්ගෙන් වළක්වා ගැනීමටත් බොරු පොරොන්දු හා විශේෂත්වයන් ද එසේ ම අවවාදයන් ද නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ නාමයෙන් ගොතා ප්‍රසිද්ධ කළහ. මොවුන් සාලිහ් තැනැත්තන් ලෙස ජනතාව අතර ගරුත්වයක් ලබා සිටි බැවින් මොවුන්ගේ අදහස් ජනයා සැක නොකර පිළිගත්හ. අනෙකුත් කණ්ඩායම් දෙස බලන කල මොවුන් ඊටත් වඩා භයානක බව හදීස් ක්ෂේත්‍රයේ ඉමාම්වරුන් සඳහන් කර ඇත.

## 02. දේශපාලනයට හා විවිධ චින්තනයන්ට ශක්තියක් වීමට.

කලීෆා උස්මාන් රළියල්ලාහු තුමාගේ කෲර ඝාතනයට පසු බිහි වූ දේශපාලනික පිරිස් වන කවාරිජ්වරුන්, රාබිලාවරුන් වන ෂීආවරුන්, උමෙයියා සහායකයන් යන අය උදහරණ ලෙස සඳහන් කළ හැකි ය.

උදාහරණයක් ලෙස "අලි රළියල්ලාහු අන්හු තුමා මිනිසුන් අතර විශිෂ්ටයෙකි. මෙය ප්‍රතික්ෂේප කරන්නා කාෆිර් වේ" යැයි අලි රළියල්ලාහු අන්හු තුමාට සහය දක්වන්නන් ද "අල්ලාහ්ට විශ්වාසවන්තයන් තිදෙනෙකි. මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා වන මම, ජිබ්රීල් අලෛහිස්සලාම් තුමා, මුආවියා රළියල්ලාහු අන්හු තුමා යන අය වෙති." යනුවෙන් මුආවියා රළියල්ලාහු අන්හු තුමාට සහය දක්වන්නෝ ද ව්‍යාජ හදීස් ගොතා ප්‍රසිද්ධ කළහ.

### 03. ඉස්ලාමය විනාශ කිරීමට උත්සාහ කළ වංචනිකයින්

ඉස්ලාමය විනාශ කිරීමට උත්සාහ කළ ඉස්ලාමීය විරුද්ධවාදීන් ඍජුව ඉස්ලාමයට විරුද්ධව කිසිවක් කරගත නොහැකි වූ විට ව්‍යාජ හදීස් මගින් එය ඉටු කර ගැනීමට උත්සාහ කළහ. පසුකාලීනව ඔවුහු සිද්දීක්වරුන් යනුවෙන් හඳුන්වනු ලැබූහ.

### 04. රාජ්‍ය පාලකයන්ගෙන් තුති පඬුරු ලබා ගැනීම

ආත්මාර්ථකාමී, මසුරු පිරිස් කලීෆාවරුන්ගේ තුති පඬුරු ලබා ගැනීමේ අදිටනින් හදීස් රැසක් ගෙතූහ.

### 05. ඉපයීම් උදෙසා කතා කියන්නන්

ආශ්චර්ය හා හැඟීම් උපදවන කතා මගින් ජනතාව උසි ගන්වා ඔවුන්ගේ සහාය හා සම්මාන ලබා ගැනීමට කතා පවසන්නෝ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සම්බන්ධ කර ගනිමින් හදීස් රැසක් ව්‍යාප්ත කළහ.

### 06. ප්‍රසිද්ධිය ලබා ගැනීමට

අප්‍රසිද්ධ කතා පැවසීම මඟින් ජනතාවගේ අවධානය තමන් වෙත ලබා ගැනීමට සමහරු හදීස් ගෙතූහ.

### 07. තැනින් තැන වෙළෙඳාම් කරන ව්‍යාපාරිකයන්

වෙළෙඳ පොළෙහි තම භාණ්ඩ ඉක්මනින් විකුණා ගැනීම සඳහා එම භාණ්ඩවලට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සම්බන්ධ කරගනිමින් හදීස් ගෙතූහ.

### 08. මූලධර්ම වාදය, ප්‍රාදේශීයත්වය උසි ගැන්වීමට

නිශ්චිත ජාතියක් හෝ ග්‍රාමයක් අන් සියල්ලට ම වඩා ශ්‍රේෂ්ඨ යැයි දැක්වීමට හදීස් ගොතන ලදි.

ඉහත සඳහන් කරන ලද හා තවත් මෙවැනි ම අරමුණු කිහිපයක් පාදක කරගෙන නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ නාමයෙන් ව්‍යාජ වැකි දහස් ගණනක් හදීස් ලෙස හඳුන්වා දෙන ලදි. ඒවා තෝරා ගෙන පැහැදිලි කිරීමෙහි ලා හදීස් ක්ෂේත්‍ර විද්වතුන් දැඩි වෙහෙසක් දරා එහි ජය ද ලැබූහ. ඔවුන්ගේ මෙම සේවාව හදීස්හි පිවිතුරු භාවය ආරක්ෂා කිරීමට මහත් රුකුලක් විය.

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

أَهْلُ السُّنَّةِ ضَعِيْفٌ الْمَوْضُوعُ

**අභ්‍යාස**

1. මව්ලූආත් කෙසේ බිහි වුණි ද?
2. මව්ලූආත් එකක් සඳහන් කරන්න.
3. මව්ලූආත් බිහිවීමට හේතු 3ක් සඳහන් කරන්න.
4. මව්ලූආත් හි නිරත වුණු කණ්ඩායම් 2ක් සඳහන් කරන්න.
5. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා වෙත බොරු කියන පුද්ගලයකුට දෙන දඬුවම් කුමක් ද?